www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නව දශකය ඇරඹෙයි

**The new decade begins**

2010 ජනවාරි 4

එක්සත් ජනපදය විසින් මධ්‍යම ආසියාව, මැද පෙරදිග නැගෙනහිර අප්‍රිකාව හා ඉන් ඔබ්බට, සිය ආක්‍රමනකාරී හා මිලිටරි ප්‍රතිපත්ති තීව්‍ර කරන බව සලකුනු කරන සිදුවීම් පෙලකින් නව දශකය ආරම්භ විය. මෙම කටයුතු මගින් ඇඟවුම් කරන්නේ, ඉරාකය හා ඇෆ්ගනිස්ථානය තුල එක්සත් ජනපදයේ මගපෙන්වීම යටතේ ගෙනයන යුද්ධ හා වෙනත් රටවල් ගනනාවක මිලිටරි මැදිහත්වීම් තුලින් පූර්ව දශකය පුරා අවුලුවන ලද ජාත්‍යන්තර ආතතීන්, වඩාත් කටුක හා පුපුරන සුලු තත්වයක් කරා වර්ධනය වනු ඇතැයි යන්නය.

ජනවාරි 2 දින ජනාධිපති ඔබාමා. ගුවන් විදුලියෙන් හා අන්තර්ජාලයෙන් සතිපතා පවත්වන සිය දේශනයේදී ප්‍රථම වතාවටත් නිල වශයෙනුත් ප්‍රකාශකර සිටියේ, ඩෙට්‍රොයිට් නගරයට ඉහලින් පියාසර කල නෝර්ත්වෙස්ට් 253 ගුවන්යානය පුපුරවා හැරීමට නත්තල් දිනයේදී දරන ලද ප්‍රයත්නයට වගකිව යුත්තේ යේමන්හි අල් කයිඩා සංවිධානය බවයි. යේමනය හා සෝමාලියාව තුල එක්සත් ජනපදයේ මිලිටරි ප්‍රචන්ඩත්වය දැඩි කිරීම සඳහා පසුබිම සකස් කරමින් ඔබාමා, සුපුරුදු පරිදි යලිත් "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" ඝෝෂාව නැංවීය. "ප්‍රචන්ඩත්වයේ හා වෛරයේ දුරදිග යන ජාලයකට එරෙහිව අප ජාතිය යුද්ධයක පැටලී සිටින අතර එය පරාජය කිරීමට හා අප රට ආරක්ෂාකර ගැනීම සඳහා අවශ්‍ය ඕනෑම පියවරක් ගැනීමට අපි කැපවී සිටින්නෙමු" යයි ඔහු කියා සිටියේය. "නැගෙනහිර ආසියාවේ සිට අග්නිදිග ආසියාව දක්වාත්, යුරෝපයේ සිට පර්සියානු බොක්ක දක්වාත් මේ අන්තවාදීන් සමග කුමන්ත්‍රනයේ යෙදෙන හා ඔවුන් පුහුනු කරන කවරෙකු මත හෝ නිර්දය ලෙස පීඩනය යෙදීමට එක්සත් ජනපදය ක්‍රියාකරනු ඇතැයි" ඔහු තව දුරටත් ප්‍රකාශ කලේය. එය වනාහි ලෝකයේ ඕනෑම කොටසක එක්සත් ජනපදයේ පූර්ව භංග මිලිටරි ප්‍රහාර සුජාත කිරීමේ සූත්‍රයකි.

යේමනය තුල එක්සත් ජනපද හා බ්‍රිතාන්‍ය තානාපති කාර්යාල වසාදමන බවට දෙරට විසින් නිකුත්කල නිවේදන මඟින් ඇඟවුනේ එරටට එරෙහිව ප්‍රබල මිලිටරි ප්‍රහාරයක හැකියාවයි.

ඉරානයට එරෙහිව "අලුතෙන් දැඩි හා ක්ෂනික සම්බාධක" පැනවීම සඳහා හඬ නගන නම් හෙලි නොකල නිලධාරීන් උපුටා දක්වමින් *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රය ජනවාරි 3 දින ලිපියක් පල කලේය. ඉරානයේ ඉස්ලාමීය විප්ලවකාරී හමුදාවන් හා සබඳකම් පවත්වන ව්‍යාපාරවලට එරෙහිව නව සම්බාධක එල්ල කෙරෙනු ඇතැයි පුවත්පත වාර්තා කලේය.

පරිපාලනය, "විප්ලවකාරී හමුදාවන්ට බැඳීම් ඇති පෙරටු ව්‍යාපාරික සමාගම් සමඟ මූල්‍ය ගනුදෙනු කපා හැරීමේදී අරාබි හා ආසියානු ජාතීන් යුරෝපය සමඟ එක පෙලකට ගෙන ඒම අරමුනු කර ගන්නා" බව පුවත් පත සඳහන් කරයි.

2003 වසරේ පටන් ඉරාන විශේෂඥයින් න්‍යෂ්ටික මිසයිලයක් සැලසුම් කිරීම සඳහා ගෙනගිය වැඩ කටයුතු නතරකර දමා ඇති බව කියා සිටින 2008 වසරේ ජාතික බුද්ධි අංශ තක්සේරුව ඔබාමා පරිපාලනය විසින් ප්‍රතික්ෂේප කර ඇති බව *ටයිම්ස්* වාර්තාව තිර කොට කියා සිටියි. මින් සනිටුහන් කෙරෙන්නේ, ඉරානය හුදෙකලා කොට දුර්වල කිරීමේ ද ටෙහෙරාන "පාලන තන්ත්‍ර වෙනසක්" ඇතිකිරීමේ ද එක්සත් ජනපද උත්සාහයේ පැහැදිලි වැඩි වර්ධනයකි.

නව වසර, ඇෆ්ගනිස්ථානය හා පකිස්ථානය තුල පුලුල් කෙරෙන යුද්ධයේ මිලිටරි ප්‍රචන්ඩත්වය තවත් ඉහල නංවනු ඇති බවට ඇඟවුම් ගෙන එයි. නව වසර උදාවෙමින් තිබියදී එක්සත් ජනපදය, ඇෆ්ගනිස්ථානයට මායිම්ව පිහිටි ගෝත්‍රික කලාපයක් වන පකිස්ථානයේ උතුරු වසිරිස්ථාන් ප්‍රදේශයට පැය 72 ක කාලයක් තුල නියමුවන් රහිත ඩ්‍රෝන් මිසයිල ප්‍රහාර තුනක් වෙන වෙනම එල්ල කලේය. මාධ්‍ය වාර්තාවලට අනුව ප්‍රහාරවලින් 7 දෙනෙකු මරුමුවට පත්විය. එවන් ප්‍රහාරවලට පසුව සුපුරුදු පරිදි කියා

සිටින ආකාරයට මෙහිදී ද කියා සිටියේ ඔවුන් තලිබාන් සටන්කාමීන් බවය.

තීව්‍රවන එක්සත් ජනපද මිලිටරි හා දේශපාලන පීඩනය හමුවේ පකිස්ථානය තුල හටගෙන තිබෙන අස්ථාවරත්වයේ ප්‍රකාශනයක්, නත්තල් දිනයේ දකුනු වසිරිස්ථානු ගමකට එල්ල කරන ලද මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය තුලින් සලකුනු විය. එයින් සිවිල් වැසියන් 75 ක් මරුමුවට පත්වූ අතර විශාල සංඛ්‍යාවක් තුවාල ලැබූහ. ඔක්තෝබරයේ සිට පකිස්ථානුවන් 500 කට අධික පිරිසකට මරු කැඳවූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර මාලාවක නවතම ප්‍රහාරය එය විය.

ඔබාමා පරිපාලනය විසින් නියෝග කරන ලද එක්සත් ජනපදය ප්‍රමුඛ හමුදා ආක්‍රමනයේ මධ්‍යස්ථානයක් වූ හෙල්මන්ඩ් ප්‍රාන්තයේ අගනුවර ආසන්න ප්‍රදේශයකට නේටෝ හමුදාව එල්ල කල මිසයිල් ප්‍රහාරයකින් දෙසැම්බර් 30 දින සිවිල් වැසියන් 7 ක් මරුමුවට පත්විය. ඊට පෙර සති අන්තයේ කුනාර් ප්‍රාන්තයට නේටෝ හමුදා කඩාවැදීමකින් පාසැල් යන වයසේ ලමුන් 8 ක් ද ඇතුලුව 10 දෙනෙක් මරුමුවට පත්විය.

ඒ සමග ම වොෂින්ටනය නව වසර ආරම්භ කලේ චීනයට එරෙහිව එල්ල කරන ලද ප්‍රකෝපකාරී පියවර මාලාවක් සමගිනි. ඉන් ඇඟවුම් කරන්නේ, ආසියාව තුල ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අධිකාරයට අභියෝග කරන දිගුකාලීන ප්‍රතිමල්ලවයා වන රටට එරෙහිව වඩා ආක්‍රමනශීලී ප්‍රතිචාරයකි.

ස්වාභාවික ගෑස් හා ඛනිජ තෙල් සාරාගැනීමට උපයෝගී කරගන්නා චීනයෙන් අපනයනය කෙරෙන වානේ පයිප්ප මත සියයට 10-15 අතර තීරු බදු පැනවීමට එක්සත් ජනපදයේ ජාත්‍යන්තර වෙලඳ කොමිසමේ අනුමැතිය දෙසැම්බර් 30 දින පලවිය. ඊට පෙර දින චීනයෙන් ගෙන්වන වානේ සීරීමේ උපකරන මත බැහැර කිරීමට එරෙහි ප්‍රාරම්භක බදු පැනවීය. ඊට මාස කීපයකට පෙර චීනයෙන් ගෙන්වනු ලබන ටයර් වලට සියයක 35 තීරු බදු පනවා තිබුනි.

චීනයට සිය යුවාන් මුදල අධිප්‍රමානය කරන ලෙසට කෙරෙන බලපෑමේ උත්සන්න අවස්ථාවක් සලකුනු කරන අලුත්ම ආරක්ෂනවාදී පියවර චීනයේ දැඩි හෙලාදැකීමට ලක් විය. මේ මගින් එක්සත් ජනපදයට කෙරෙන චීන නිර්යාත පහත හෙලීමටත් චීනයට හා අනෙකුත් රටවලට කෙරෙන එරට අපනයන වැඩිකර ගැනීමටත් හැකිවෙයි.

එක්සත් ජනපදයේ නව පියවර, අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය හෙවත් ආසියාන් සංවිධානයේ රටවල් 10 ක් අතර නිදහස් වෙලඳ කලාපයක් ජනවාරි 1 දින නිල වශයෙන් දියත් කිරීමත් සමග සම්පාත විය. ලෝකයේ තෙවන විශාලතම වෙලඳ කාන්ඩය වන, බීජිනය විසින් නායකත්වය දෙනු ලබන නව වෙලඳ කන්ඩායම වොෂින්ටනය විසින් දැක ගන්නේ, කලාපය තුල එක්සත් ජනපදයේ ආර්ථික ආධිපත්‍යයට එල්ල වන තර්ජනයක් ලෙසය. මෑත වසරවල චීනය, එක්සත් ජනපදය පසුකර යමින් ජපානය හා යුරෝපා සංගමයට පසුව ආසියාන් සංවිධානයේ තෙවන විශාලතම හවුල්කරුවා බවට පත්ව තිබේ.

මීට අමතරව, ජනවාරි 3 දින *වොෂින්ටන් පෝස්ට්* පත්‍රය පලකල වාර්තාවකට අනුව, ඔබාමා පාලනාධිකාරය බ්ලැක් හෝක් හෙලිකොප්ටර් හා මිසයිල් නාශක ඇතුලු උපකරන තොගයක් එලඹෙන මාස කිහිපය තුල තායිවානයට අලෙවි කිරීම පිලිබඳව තීරනයක් ගැනීමට නියමිතය. තව ද ඔබාමා, දලෙයි ලාමා මුනගැසීමට ද සැලසුම් කර තිබේ.

ඇමරිකානු පාලක ප්‍රභූවේ චීන විරෝධී ආරක්ෂනවාදී මනෝභාවයන් දැඩිවීම, ලිබරල් අර්ථශාස්ත්‍රඥ හා *නිව් යෝර්ක් ටයිම්ස්* තීරු රචක පෝල් කෘග්මන් ජනවාරි 1 දින පලකරන ලද යුදවාදී විවරනයක් තුල ප්‍රකාශ විය. චීනයේ ව්‍යවහාර මුදල හා වෙලඳ ප්‍රතිපත්ති "කොල්ලකාරී" බව පවසමින් ඔහු, එක්සත් ජනපදයේ හා යුරෝපා සංගමයේ ආරක්ෂනවාදී පියවර ආරක්ෂා කලේය. එම පියවර ගැනීමට තුඩු දුන්නේ "නිශ්චිතවම සිය ව්‍යවහාර මුදලේ අගය අධිප්‍රමානය වීමට ඉඩහැරීම චීනය විසින් ප්‍රතික්ෂේප කල බැවිනි." කෘග්මන් පැවසීය.

"එවන් තවත් පියවර ගැනීම පවා මුලුමනින්ම කාලීන වන බව" ඔහු වැඩිදුරටත් පැවසීය. ඔවුන්ගේ " මුරන්ඩුකම" ගැන "යලි සිතාබලන" ලෙසත් නැත්නම් "පටන්ගනු ඇති ඊටත් වඩා විශාල දෙයකට" සූදානම් වන ලෙසටත් සිය විවරනය තුල ඔහු අනතුරු ඇඟවීය.

එක්සත් ජනපදයේ ද ලෝකය පුරා ද මිනිසුන් "21 වන සියවසේ යුද්ධවලට" පිය නගන බව කියාදීමට, පසුගිය දශකය මුලදී හිටපු ජනාධිපති ජෝර්ජ් බුෂ් සැප්තැම්බර් 11 සිද්ධි නිමිත්තක් කොටගත්තේය. ජාත්‍යන්තර නීති උල්ලංඝනය කරමින් එක්සත් ජනපදය, 2002 වසරේදී නිවාරක යුද පිලිවෙත වැලඳ ගත්තේය. ඇමරිකාවේ ගෝලීය අවශ්‍යතාවන්ට දැනට හෝ අනාගතයේදී තර්ජනයක් වන්නේ යයි සලකන ඕනෑම රටකට එරෙහිව පහරදීමට වොෂින්ටනයට ඇති අයිතිය එමගින් අවධාරනය කෙරෙයි.

නව දශකය ආරම්භයේ දී මෙම පිලිවෙත ශක්තිමත් කරමින් ද ව්‍යාප්ත කරමින් ද තිබේ. ජනතාවගේ යුද විරෝධයට ආයාචනය කරමින් රිපබ්ලිකානු ජනාධිපති

වෙනුවට ඩිමොක්‍රටික් ජනාධිපති කෙනෙක් ද රිපබ්ලිකන් කොන්ග්‍රසයක් වෙනුවට ඩිමොක්‍රටික් කොන්ග්‍රසයක් ද පත්කර ගැනීම මගින් ඇමරිකානු අධිරාජ්‍යවාදයේ මූලික පිලිවෙත් කිසිවක් කෙරෙහි බලපෑමක් සිදුව නැත.

ලෝකය, පසුගිය දශකයේ පමනක් නොව පසුගිය සියවසේ අත්දුටු මහා ව්‍යසනයන් පරයා යන විනාශයන්ගේ තර්ජනයට මුහුන දී සිටියි. කම්කරු පන්තිය සමාජ හා දේශපාලන කැලඹීම් ගහන නව අවධියකට ඇතුල්වන විට ඉතිහාසයේ කේන්ද්‍රීය පාඩම් උගත යුතුය. අධිරාජ්‍යවාදී යුද්ධය අවසන්කල හැක්කේ ඔබාමා පාලන තන්ත්‍රයටත් සියලු ධනේශ්වර පක්ෂවලටත්, යුද්ධයට මූලික හේතුව වන ධනවාදයටත් එරෙහිව කම්කරු පන්තිය ජාත්‍යන්තරව බලමුලු ගැන්වීමෙන් පමනි.

**බැරී ග්‍රේ**

© www.wsws.org